


කොස්තාපල් පුඤ්ඤදසෝම බුද්ධියෙන් අගතැන්පත් පොලිස් නිලධාරියෙක් කියලා තමයි හැම තැනම ප්‍රසිද්ධ. ඔය හැම තැනම ප්‍රසිද්ධ කතාවක් තියෙනවනෙ වාහනේක ඇන්ජිමක් හොරා ගත්ත මිහිහෙක් අල්ලපු එක ගැන. ඇත්තම කියනවා නම් ඒකත් අපේ පුඤ්ඤදසෝමගෙ වැඩක්. දන්වනෙ අපේ මිනිස්සු බුද්ධිමය දේපළ ගැන තඹයක් තකන්නෙ නැහැ කියලා. ඉතින් පුඤ්ඤදසෝමට අයිති මේ කතාවත් අනවසරයෙන්ම වෙන වෙන එය වෙන වෙන අයගෙ නම් වලට ලියලා තියෙනවා. නොදන්න අය වෙනුවෙන් ඒ කතාවත් ලියලාම ඉමුකෝ.

ඔන්න හැත්තෑව අසූව කාලෙ දවසක වතාවක් කොස්තාපල් පුඤ්ඤදසෝම රෑ ඩියුටියක ඉන්නවා. චෙක් පොයින්ට් එකක. ඔන්න එනවා ෆොක්ස්වගන් කාරෙකක් හෙමින් හෙමින්. එන තාලෙන්ම පේනවා මොකක් හරි මගඩියක් කරලා එන බව.

පුඤ්ඤදසෝම පැන්නා පාරට. නැවැත්තුවා කාරෙක.

කාරෙකෙන් බැස්සා බොහොම බයාදු පාට පොරක්.

"තමුසෙ මොනවා හරි හොරකම් කරගෙන යනවා නේද?" පුඤ්ඤදසෝම රාජකාරි ස්වරයෙන්ම ඇහුවා.

"අනේ නෑ රාළහාමි" මිනිහා කිව්වා.

"අනේ නෑ.. තමුසෙ කොහොමද මාව තම්බන්නෙ.. අරිනවා ඩිකිය.. "

"අනේ රාළහාමි.."

"අනේ පනේ නෙවෙයි.. අරිනවා ඩිකිය"

මිනිහා බොහොම අකමැත්තෙන් වගේ කාරෙකේ ඉස් සරහට ගියා.

"ඔය කොහෙද යන්නෙ.. දෙන්නං අද උඹට සබ්බුව" කොස්තාපල් පුඤ්ඤදසෝම තමන්ම ගිහින් කාරෙකේ පිටිපස්සෙ ඩිකිය ඇරියා ".. අහුවුණා උඹ අද.." පුඤ්ඤදසෝම උජාරුවෙන් කෑගැහුවා ".. තමුසෙ ඇන්ජිමක් හොරකම් කරගෙන යනවා නේද..?"

පුඤ්ඤදසෝම දැනගෙන උන්නෙ නැහැ ෆොක්ස්වාගන් කාර් වල ඇන්ජිම තියෙන්නෙ පිටිපස්සෙ බව.

හැබැයි ඒක නෙවෙයි අද මං කියන්න ආව කතාව. පහුගිය භීෂණ කාලෙ අපේ කොස්තාපල් මහත්තයා ඩියුටියක් කළා තවත් කොස්තාපල් මහත්තුරු දෙන්නෙක් එක්ක.

වට පිට බලමින් යනකොට මෙන්න සැකකටයුතු පාර්සලයක්. තුන්දෙනා හෙමිහිට කොනකින් ඇරලා බැලුවා. හත්දෙයියනේ බෝම්බ.. ඒකක් දෙකක් නෙවෙයි. බෝම්බ තුනක්ම..

ඔන්න පුතෝ චාන්ස් එක. මේක ලොක්කට පෙන්නුව ගමන් අපට පටියක් වදිනවා ෂුවර්.. මෙච්චර කාලයක් කොස්තාපල් කමේ ඉඳලා සාජන් පටියක් වත් වැදුනොත් කොහොමද?

දැන් ඔන්න තුන්දෙනා බෝම්බ පාර්සලෙත් උස්සගෙන යනවා පොලිස්සියට. යන ගමන් එක රාළහාමි කෙනෙක් මෙහෙම අහනවා.

"දැන් අපි මේ බෝම්බ පාර්සලේ උස්සගෙන යනවනෙ.. බැරිවෙලාවත් මේකෙන් එකක් පිපිරුණොත් මොකද වෙන්නෙ..?"

මෙහෙමත් අඥාන රාළහාමි කෙනෙක්. පුඤ්ඤදසෝම හිතුවා

"එහෙම වුණොත් අපි ලොක්කට කියනවා බෝම්බ දෙකයි තිබුනෙ කියලා" පුඤ්ඤදසෝම බුද්ධිමත් ලෙස පිළිතුරු දුන්නා

ශ්‍රීනාත් මද්දුමගේ

THE PIONEERS OF THE SHIPPING SERVICE

To Every Coner of SRI LANKA

▶FAST
▶EFFICIENT
▶RELIABLE SERVICE

1300 190 762
KALYANA GURUGE - 0416 247 725

SHIPPING SCHEDULE 2013 - SRI LANKA - SYDNEY

| CUT OFF DATE SYDNEY | END SYDNEY | ETA COLOMBO |
|---|---|---|
| 12 OCT 13 | 16 OCT 13 | 18 NOV 13 |
| 23 OCT 13 | 27 OCT 13 | 30 NOV 13 |
| 02 NOV 13 | 06 NOV 13 | 09 DEC 13 |
| 09 NOV 13 | 13 NOV 13 | 16 DEC 13 |
| 07 DEC 13 | 11 DEC 13 | 13 JAN 14 |




NEXUS CORP
INTERNATIONAL PTY LTD

8/2 Ash Road Prestons NSW 2170
(Cnr Hoxton Park Road)
Tel: 02 8798 1894 / 02 8798 3195
www.nexuscorp.com.au

Office Hours: Mon - Fri 7.00am - 3.00pm After Hours Contact : nexuscorp@optusnet.com.au or 0416 247 725 till 7.00pm

**Work Available**

Contract packing work available in Bayswater. Day and Afternoon shift. Please call 0418 122 297 for further information

**ඇබෑර්තු ඇත**

බේස්වෝටර් ප්‍රදේශයේ කොන්ත්‍රාත් පදනමින් ඇසුරුම් කිරීමේ ඇබෑර්තු ඇත.
උදෑසන සහ සවස වැඩ මුර.
වැඩි විස්තර 0418 122 297 දුරකතන අංකයෙන් විමසන්න.

**VCE Chemistry 2014**

Individual and Groups
Early completion of syllabus and Exam preparation
Home Visited

**Priyantha Liyanage**
0407664546

**WEST END CoNCERT DVD**

මාර්තු 10 සිට ශ්‍රී ලාංකික වෙළඳසල් වලින් ලබා ගත හැකිය
මෙයින් ලැබෙන මුදලින් අසරණ තත්වයට පත්ව සිටින ශ්‍රී ලාංකික කලාකරුවන් දෙදෙනකුට පිහිට වීමට බලපාපොරොත්තු වෙමු
ඩීවීඩී තැටියක මිල ඩොලර් 10කි

විමසීම්

**සුසිල් 0411 569 811**